**වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව**

**වවුනියාව දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු **27** දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව පිළිවෙලින් 2019 ජූනි 30 දින හා 2019 ඔක්තෝබර් 31 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (2) වන උප වගන්තියට අනුව, මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | ජාතික විගණන පනතේ උපදෙස් පිළිපැදිය යුතුය. | පිළිතුර සපයා නොතිබුණි. |

**(ආ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සභාව විසින් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. | සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරි වර්ෂයේදී අනාවරණය කර නිවැරදි කරනු ලැබේ. |

**(ඇ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) සභාවේ වත්කම් පහක් භෞතිකව නොතිබුණි. කෙසේ වෙතත්, වර්ෂය අවසානයේදී වත්කම්වල වටිනාකමට ඒවා ඇතුළත් කර ඇති අතර, ඒ අනුව 2018 දෙසැම්බර් 31 දිනට වත්කම්වල වටිනාකම රු.1,794,960 කින් වැඩියෙන් දක්වා තිබුණි. | භෞතිකව පවතින භාණ්ඩ පමණක් මූල්‍ය ප්‍රකාශනවල පෙන්විය යුතුය. | එවැනි වත්කම් 05 ක් කපා හරින ලෙස පළාත් පාලන කොමසාරිස් වෙත ප්‍රාදේශීය සහකාර පළාත් පාලන කොමසාරිස් හරහා ලිපියක් මගින් දැනුම් දෙන ලදී. කෙසේ වෙතත්, මෙම වාර්තාවේ දිනය දක්වා අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ii) සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගත් රු.278,265 ක් වූ තිර රෙදි සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබීම හේතුවෙන් වත්කම් අඩුවෙන් ගණනය කර තිබුණි. | සියලුම ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශනවල පෙන්විය යුතුය. | තිර රෙදිවල ප්‍රයෝජනවත් ආයු කාලය කෙටි එබැවින් එම වටිනාකම වත්කම් ගිණුමට ඇතුළත් කර නොතිබුණි. |
| (iii) සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු.174,155 ක් වටිනා ශබ්දවාහිනී කට්ටලය මූල්‍ය ප්‍රකාශනවලට රු.170,905 ක් ලෙස ගෙන තිබීම නිසා වත්කම් අඩුවෙන් ගණනය කර තිබුණි. | වත්කම්වල අගයන් මූල්‍ය ප්‍රකාශනවල මුළුමනින්ම ඇතුළත් කළ යුතුය. | ශබ්දවාහිනී කට්ටලයේ වටිනාකම රු.174,155 කි. කෙසේ වෙතත්, එම කට්ටලයේ සම්බන්ධක වයර්වල වටිනාකම රු.3,250 ක් වන අතර, එම අගය අඩු කිරීමෙන් පසු රු.170,905 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. |

**(ඈ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොතිබීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉඩම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය සහ ස්ථිර තැන්පතු සහතිකය වැනි සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.175,584,630 ක් වටිනා ගිණුම් අයිතම 5 ක් සතුටුදායක ලෙස සහතික කිරීමට හෝ විගණනයේදී පිළිගැනීමට නොහැකි විය. | ශේෂයන් පිළිබඳ සහතික කිරීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. | පිළිතුරු සපයා නොතිබුණි. |

**1.4 අනුකූල නොවීම්**

-------------------

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | --------------------------- | ------------------- | ----------- | ----------------------- |
| (අ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | රීති අංක 60 | සභාවේ විෂය පථයට ගැනෙන ව්‍යාවසායන් පිළිබඳ තොරතුරු පිළිබඳ සමීක්ෂණයක් වසර ආරම්භයේදී සිදු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීති අනුව ක්‍රියා කළ යුතුය. | ව්‍යාවසායන් පිළිබඳ විස්තර ඇතුලත් සමීක්ෂණයක් 2019 වර්ෂය ආරම්භයේදී සිදු කර තිබූුණ අතර තොරතුරු ලේඛණගත කර තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | (i) මුදල් රෙගුලාසි 237 | සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සභාව විසින් කරන ලද රු.2,785,720 ක ගෙවීම් සමඟ සභාව විසින් ලබා දුන් සතුටුදායක ලෙස ක්‍රියාකර ඇති බව තහවුරු කෙරෙන සහතිකයක් අමුණා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | වැරදීමකින් මෙම සහතික ලබාගෙන අමුණා නොතිබුණි. මෙම සහතිකය ලබාගෙන අනාගත කාලවලදී කරනු ලබන ගෙවීම් සමඟ අමුණනු ඇත. |
| | (ii) මුදල් රෙගුලාසි 371(5) | පසුගිය වසර දෙක තුළ රු.251,554 ක අත්තිකාරම් 06 ක් සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව පියවර ගත යුතුය. | අත්තිකාරම් ගිණුමෙන් රු.22,277 ක මුදල කපා හැරීමටත් ඉතිරි මුදල නිවැරදි කිරීමටත් කටයුතු කරණු ලැබේ. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| | 178(3) වගන්තිය | ප්‍රජා මූලික සංවිධාන සහ | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ | පිළිතුරු සපයා නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | කොන්ත්‍රාත් කටයුතු ඵලදායී ලෙස සිදුකරන ප්‍රජා මධ්‍යස්ථාන නම් ඇතුළත් ලේඛනයක් සකස් කර නොතිබුණි. | අනුව ක්‍රියා කළ යුතුය. | |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක. 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ සභාවේ වාහන 19 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මේ වන විට, 2019 අප්‍රේල් 05 වන දින වාහනවල ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර ඇත. |
| (ඉ) | 2017 ජුනි 28 දිනැති අංක. 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය. | සභාවේ සියලුම වත්කම් ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදාළ ලියකියවිලි අමුණා සභාවේ ඉඩම් සහ ගොඩනැගිලිවලට වෙන් වෙන්ව ගොනු පවත්වා ඇත. |

### 1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| **විගණන නිරීක්ෂණ** | **නිර්දේශ** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 වගන්තිය අනුව භාණ්ඩ හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත් කටයුතු සඳහා එකතු කළ අගය මත බද්ද ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතුය. එම ගෙවීම් පිළිබඳ විස්තර ඊළඟ මාසයේ 15 වන දිනට හෝ ඊට පෙර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. රු.2,827,629 ක් වටිනා එකතු කළ අගය මත බදු ගෙවීම් විගණනයට දැනුම් දී නොතිබුණි. | එකතු කළ අගය මත බදු සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. | ඉදිරි කාලවලදී පිටපතක් ඔබ වෙත යොමු කිරීමට උපදෙස් ලබා දී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,392,468 ක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,252,868 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,500,000 | 32,749,905 | 3,499,360 | 1,883,898 | 3,500,000 | 3,295,230 | 2,379,703 | 2,140,602 |
| (ii) | කුලී | 3,007,300 | 3,007,300 | 23,066,125 | 10,103 | 3,161,554 | 3,161,544 | 2,929,684 | 655,740 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,160,000 | 2,160,000 | 2,305,730 | - | 2,240,000 | 2,240,000 | 1,868,810 | - |
| (iv) | වෙනත් ආදායම් | 62,913,716 | 62,913,716 | 45,192,887 | 20,944,685 | 57,387,292 | 15,002,000 | 29,746,385 | - |
| | එකතුව | **71,581,016** | **100,830,921** | **74,064,102** | **22,838,686** | **66,288,846** | **23,698,774** | **36,924,582** | **2,796,342** |

### 2.2.2 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අයවැය ඇස්තමේන්තුව නිසියාකාරව සකස් කර නොතිබූ අතර ඇස්තමේන්තු නිසි පරිදි සැලසුම් කර වැඩසටහන්ගත කර නොතිබූ අතර, ඒ අනුව අයවැයගත ආදායම සහ තත්‍ය ආදායම අතර රු.145,730 සිට රු.7,044,293 දක්වා විචලායයන් විගණනයේදී නිරීක්ෂණය විය. | අයවැය නිසි ලෙස සකස් කළ යුතුය. | පිළිතුරු සපයා නොතිබුණි. |
| (ආ) | පසුගිය වසර 29 ක කාලයක සිට සභාවට ලැබිය යුතු ආයුර්වේද පරිත්‍යාගයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල රු.38,280 ක මුදලක් පෙන්වනු ලැබීය. කෙසේ වෙතත්, ඒ සඳහා හේතු නිසියාකාරව විගණනය සඳහා ලබා දී | ආයුර්වේද පරිත්‍යාගයේ හිඟ මුදල් අය කර ගැනීමට පියවර ගත යුතුය. | පිළිතුරු සපයා නොතිබුණි. |

නොතිබුණු බැවින් විගණනයේදී එය සතුටුදායක ලෙස සහතික කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

**2.2.3 වරිපනම් හා බදු**

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පසුගිය අවුරුදු 01 සිට 05 දක්වා කාලයතුල එකතු වටිනාකම 1,883,898 ක් වූ හිඟ වරිපනම් ගාස්තු සහ බදු අයකර ගැනීමට අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | හිඟ වරිපනම් ගාස්තු සහ බදු අයකර ගැනීමට පියවර ගත යුතුය. | හිඟ බදු අය කර ගැනීම සඳහා ජංගම සේවා පවත්වා තිබේ. |

**2.2.4** බලපත්‍ර ගාස්තු

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ලේඛණ හා වාර්තා පිළිබඳ විගණන පරීක්ෂාවේදී වෙළඳ බලපත්‍ර ගාස්තු ආයතන 1397 කින් ලැබී තිබුණි. කෙසේ වෙතත්, ආයතන 1354 ක් සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | සියලුම ආයතනවලට වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමට පියවර ගත යුතුය. | මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කරන ලෙස අයදුම්කරුට දන්වා තිබුණද, ලැබුණු අයදුම්පත් නැවත ඉදිරිපත් නොකිරීම, ඉඩම් ඔප්පු සහ ගොඩනැගිලි අනුමැතිය ඉදිරිපත් නොකිරීම වැනි හේතු මත නිවැරදි කරන ලද අයදුම්පත නැවත පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කර නොමැති වීම හේතුවෙන් වෙළඳ බලපත්‍රය ඉදිරිපත් කර නොතිබුණි. |

**2.2.5 වෙනත් ආදායම්**

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් J.C.B මෝටර් ග්‍රේඩරය හා මෝටර් රෝලරය පසුගිය වසර 01 සිට 06 දක්වා කාලය තුළ කුලියට දීමෙන් අයකර ගැනීමට ඇති රු.586,193 ක් වූ හිඟ ආදායම් වර්ග 12 ක් අයකර ගැනීමට අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | හිඟ ආදායම අය කර ගැනීමට අර්ථවත් ක්‍රියාමාර්ග ගත යුතුය. | පිළිතුරු සපයා නොතිබුණි. |

**2.2.6** උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) උසාවි දඩ මුදල්** | | |
| 2018 දෙසැම්බර් 31 දින වන විට එකතු වටිනාකම රු.6,684,882 ක උසාවි දඩ මුදලක් පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියලු බලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබුණි. | උසාවි දඩ මුදල් නියමිත කාල සීමාව තුළ අය කර ගත යුතුය. | හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගනිමින් සිටී. |
| **(ආ) මුද්දර ගාස්තු** | | |
| 2018 දෙසැම්බර් 31 දින වන විට එකතු වටිනාකම රු.12,223,010 ක මුද්දර ගාස්තු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියලු බලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබුණි. | මුද්දර ගාස්තු නියමිත කාල සීමාව තුළ අය කර ගත යුතුය. | මුද්දර ගාස්තු මුළුමනින්ම අයකර ගැනීමට මේ වන විට පියවර ගෙන තිබේ. |

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කාර්යසාධනය

මහජන සෞඛ්‍ය, මහජන උපයෝගීතා සේවා සහ මහජන මංපෙත් විධිමත් කිරීම සහ සුවපහසුව, පහසුව සහ ජනතාවගේ සුභසාධනය වැනි කාරණා විධිමත් කිරීම සහ පාලනය කිරීම වැනි ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නිරීක්ෂණය කළ කරුණු පහත දැක්වේ.

**(අ)** අතුරු ව්‍යවස්ථා

| ( විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය ප්‍රකාරව ප්‍රධාන කාර්යයන් 30 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු විය. නමුත් 2018 දෙසැම්බර් 31 වන විට පවා කාර්යයන් 02 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | ප්‍රදේශ් සභා පනතේ 126 වන වගන්තිය ප්‍රකාරව ප්‍රධාන කාර්යයන් 30 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුය. | සභාවේ විෂය පථය යටතේ අයකර ගනු ලබන සියලුම ආදායම් සඳහා අතුරු ව්‍යවස්ථා නීතිගත කර ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති අතර ආදායම අයකර ගනිමින් පවතී. |

ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් 17 සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. | පිළිතුරු සපයා නොතිබුණි. |

(ඇ) **ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් සිදු කරන ලද රු.26,015,663 ක් වටිනා ක්‍රියාකාරකම් 09 ක කාර්යසාධනයේ ප්‍රමාදන් විය. | කටයුතු නියමිත කාල සීමාව තුළ සම්පූර්ණ කළ යුතුය. | අපේ ප්‍රදේශයේ කොන්ත්‍රාත් කාලය තුළ වැසි සහිත කාලගුණය හේතුවෙන් ප්‍රමාදයන් සිදුවිය. අපේක්ෂිත කාල සීමාව දීර්ඝ කර තිබුණි. |

(ඇ) සන

**අපද්‍රව්‍ය**

(ඇ) සන අපද්‍රව්‍ය **කළමනාකරණය**

සන අපද්‍රව්‍ය සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරන ලදී.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- | --- |
| (i) | කසළ බැහැර කරන ස්ථාන සඳහා පාරිසරික බලපත්‍ර ලබාගෙන නොමැත. | බලපත්‍ර ලබා ගත යුතුය. | මේ සම්බන්ධයෙන් පියවර ගනු ඇත. |
| (ii) | සනීපාරක්ෂක කම්කරුවන් වාර්ෂිකව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කර නොමැත. | සනීපාරක්ෂක කම්කරුවන් වාර්ෂිකව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කළ යුතුය | මෙම වසරේ සිට මෙම ක්‍රියා පටිපාටිය අඛණ්ඩව අනුගමනය කරනු ඇත. |
| (iii) | කසළ වෙන වෙනම වර්ගීකරණය කොට එකතු කර නොතිබුණි. | කසළ වර්ගීකරණය කර එකතු කළ යුතුය. | ඉදිරියේදී කසළ වර්ගීකරණය කර නිසි ලෙස ප්‍රතිචක්‍රීකරණයට ලක් කරනු ලැබේ. |
| (iv) | සභාවේ කසළ බැහැර කරන ස්ථානයට ගෙන එන කසළ වර්ගීකරණය කිරීමේ වැඩ සැලැස්මක් ක්‍රියාත්මක කර | කසළ වර්ගීකරණය සඳහා වැඩ සැලැස්මක් සකස් කළ යුතුය. | එම යාන්ත්‍රණය කෙටි කාලයක් තුළ ස්ථාපිත කෙරේ. |

| | | | |
|---|---|---|---|
| | නොමැත. | | |
| (v) ( | අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණුව නිලධාරීන්ට ලබා දී නොතිබුණි. | අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණුව නිලධාරීන්ට ලබා දිය යුතුය. | පියවර ගනු ඇත. |
| (vi) | අපද්‍රව්‍ය කළමනාකරණයට අවශ්‍ය තොරතුරු හා දත්ත පද්ධතිය නඩත්තු කර නොමැත. | අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දත්ත හා තොරතුරු ක්‍රමානුකූලව සකස් කළ යුතුය. | ඉදිරි කාලවලදී දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමට පියවර ගනු ලැබේ. |
| (vii) | ප්‍රතිචක්‍රීකරණයට භාජනය කිරීමෙන් තොරව පරිසරයට හානි වන අයුරින් ඝන අපද්‍රව්‍ය ගිනි තබා තිබුණි. | ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට භාජනය කළ යුතුය. | ආදේශක යෝජනා ක්‍රමයක් ළඟදීම ක්‍රියාත්මක කරනු ලැබේ. |

**ඉ) තිරසර සංවර්ධන අරමුණු**

-----------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2018 අප්‍රේල් 23 දිනැති අංක ඒ.එස්.පොදු/2018/61 දරන චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා සභාවේ පෙර සූදානම් වීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කල යුතුය. | පිළිතුරු සපයා නොතිබුණි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

| | **විගණන නිරීක්ෂණ** | **නිර්දේශ** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම්** |
|---|---|---|---|
| (අ) | 2006 වර්ෂයේදී පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කරන ලද රු.147,637 ක් වටිනා ඡායා පිටපත් යන්ත්‍ර දෙකක් මේ දක්වා භාවිතා කර නොතිබුණි. | එ්වා භාවිතා කිරීමට හෝ විකිණීමට පියවර ගත යුතුය. | ඡායා පිටපත් යන්ත්‍ර දෙක භාවිතා කළ නොහැකි වූ අතර, ඒ අනුව 2018 වර්ෂයේ වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය විසින් වෙන්දේසියෙන් විකිණීමට නිර්දේශ කර ඇත. |
| (ආ) | සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා "කේ" ආකෘති පත්‍රය මුද්‍රණය කිරීම හා සැපයීම සඳහා සභාව විසින් රු.92,690 ක් වියදම් කර ඇත. කෙසේ වෙතත්, ආකෘති පත්‍ර 1512 ක් එම ආකෘති පත්‍ර නිකුත් කරන ලද නිලධාරීන් විසින් නිකුත් නොකර සභාවේ පැවතුණි. මේ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් කිසිදු | ආකෘති පත්‍ර සම්පූර්ණයෙන් නිකුත් කිරීමට පියවර ගත යුතුය. | දේපල හිමිකරුවන් විසින් කාර්යාලයෙන් පෝරම ලබාගෙන වහාම තක්සේරු බද්ද ගෙවීමට කටයුතු කරමින් සිටී. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | |
| (ඇ) | 2016 වර්ෂයේ දී විවිධ ණයගිම් ගිණුමේ දක්වා තිබුණු ණයහිමියන් දෙදෙනෙකු සඳහා ගෙවියයුතු රු.145,111 ක මුදලක් ගෙවීමෙන් තොරව වසර දෙකකට අධික කාලයක සිට අඛණ්ඩව ගිණුම්වල ගෙවිය යුතු ලෙස දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ණයහිමි හිඟ මුදල් පියවීමට පියවර ගත යුතුය. | රු.72,750 ක ණයහිමියන් මෙම මාසය අවසානයේදී ගෙවා දැමීමට කටයුතු කරමින් සිටී. |
| (ඈ) | ණයහිමියන් 20 දෙනෙකුට ගෙවිය යුතු රු.34,132,790 ක මුදලක් 2018 දෙසැම්බර් 31 දින වන විට පියවීමට අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ණයහිමියන්ට ගෙවිය යුතු හිඟ මුදල් පියවිය යුතුය. | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන අරමුදල ලැබීමෙන් පසු ගෙවීම් කරනු ලැබේ. |

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | **සේවක මණ්ඩල පුරප්පාඩු** | | |
| | 2018 දෙසැම්බර් 31 දින වන විට සභාවේ කාර්යමණ්ඩල පුරප්පාඩු හතක් පුරවා නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට පියවර ගත යුතුය. | ද්විතීයික මට්ටම සඳහා පුරප්පාඩු දෙකක් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ ලේකම් කාර්යාලය විසින් පිරවිය යුතු අතර ප්‍රාථමික මට්ටමේ නිශ්චිත නොවූ පුරප්පාඩු 05 ක් පිරවීමට කටයුතු කර ඇත. |
| **(ආ)** | **සේවක ඇප තැන්පතු** | | |
| | නිලධාරීන් තිදෙනෙකු දීර්ඝ කාලයකට පෙර සභාවෙන් ඉල්ලා අස්වී තිබුණි. කෙසේ වෙතත්, 2018 දෙසැම්බර් 31 දින වන විට සභාවේ සේවක ඇප තැන්පතුවල ඇතුළත් රු.12,500 ක මුදලක් ආපසු ගෙවීමට පියවර ගෙන නොතිබුණි. | ඇප මුදල් ආපසු ගෙවීමට පියවර ගත යුතුය. | මෙම වසරේ එකී ඇප තැන්පතු ආපසු ගෙවීමට පියවර ගනිමින් සිටී. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පසුගිය වසර 11 ක කාලය තුළ සභාවේ විෂය පථය යටතේ වූ දේපල නැවත තක්සේරු කිරීම සහ දේපල සඳහා තක්සේරු බද්ද අයකර ගැනීම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දේපල නැවත තක්සේරු කිරීම සහ දේපල සඳහා තක්සේරු බද්ද අයකර ගැනීම සඳහා පියවර ගත යුතුය. | පිළිතුරු සපයා නොතිබුණි. |
| (ආ) | 1987 සිට මේ දක්වා සභාවට අයත් කුටි දෙකක් කුලියට ගෙන තිබුණි. එහි ප්‍රතිපලයක් ලෙස රු.302,400 ක ආදායම් අහිමිවීමක් සභාවට සිදුවී තිබුණි. මේ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | කොන්ත්‍රාත්තුව අනුව ක්‍රියාකිරීමට පියවර ගත යුතුය. | ඉදිරි වසරවලදී කොන්ත්‍රාත්තුව වසරක කාලයක් සඳහා සීමා කිරීමට තීරණය කරන ලද අතර ටෙන්ඩර් කැඳවීමෙන් කුටි කුලියට දෙනු ලැබේ. |
| (ඇ) | 2013 සිට 2018 දක්වා කාලය තුළ ගොඩනැගිලි 2137 ක් සඳහා සභාව විසින් අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත්, අනුකූලතා සහතිකය ලබාදී ඇත්තේ පාර්ශව 123 කට පමණි. පාර්ශවයන් 2014 කට අනුකූලතා සහතිකය නිකුත් කිරීමට පියවර ගෙන නොතිබුණි. | අනුකූලතා සහතිකය නිකුත් කිරීමට පියවර ගත යුතුය. | අනුකූලතා සහතිකයක් ඉල්ලීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කර ඇති අවස්ථාවකදී අනුකූලතා සහතිකය නිකුත් කළ හැකිය. |
| (ඈ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 49 වන වගන්තිය ප්‍රකාරව, ගොඩනැගිලි දෙකක වෙළඳ කටයුතු සිදු කෙරිණි. කෙසේ වෙතත්, ප්‍රාදේශීය සභා පනත යටතේ ගොඩනැගිලි අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අදාළ නීතිරීතිවල උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. | පිළිතුරු සපයා නොතිබුණි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.3.1 නඩත්තු හා අළුත්වැඩියා කිරීමට අසමත් වීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මේ දක්වා සභාවේ වාහන 02 ක් භාවිතා කිරීමට පියවර ගෙන නොතිබුණි. | ඒවා භාවිතයට ගත හැකි ආකාරයෙන් අලුත්වැඩියා කිරීමෙන් භාවිතයට ගත යුතුය. | පිළිතුරු සපයා නොතිබුණි. |

**3.5.2 පවරානොගත් වත්කම්**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- | --- |
| (අ) | සභාව භාවිතා කරන ඉඩම් 61 ක අයිතිය සභාවට පවරා නොතිබුණි. | ඉඩම්වල අයිතිය සභාවට පැවරීමට පියවර ගත යුතුය. | පිළිතුරු සපයා නොතිබුණි. |
| (ආ) | පරිත්‍යාගයක් ලෙස ලැබුණු වාහන දොළහක් සභාවට අයත් නොවීය. | වාහනවල අයිතිය පැවරීමට පියවර ගත යුතුය. | පිළිතුරු සපයා නොතිබුණි. |

**3.5.3 ඌන උපයෝජිත වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාව විසින් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වැඩ යෝජනා ක්‍රමය යටතේ ක්‍රීඩා පිටියේ පිවිසුම් ගේට්ටුව අසල නාම පුවරුවක් ඉදිකිරීම 2015 මාර්තු 09 වන දින රු.577,095 ක වියදමින් අවසන් කර තිබුණි. කෙසේ වෙතත්, ක්‍රීඩා පිටිය සභාවට අයත් නොවූ බැවින් මෙම වාර්තාවේ දිනය දක්වා ක්‍රීඩා පිටිය භාවිතා කර නොතිබූ අතර මේ දක්වා එහි අයිතිය පැවරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | භාවිතයට පියවර ගත යුතුය. | ක්‍රීඩා පිටියේ හිමිකාරිත්වය සභාවට පැවරීමට හා එය භාවිතා කිරීමට පියවර ගෙන තිබුණි. |
| (ආ) | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ සංවර්ධන ප්‍රදාන යෝජනා ක්‍රමය යටතේ සභාව විසින් සිදු කරන ලද සීතාම්පරනගර් හි නල ජල සැපයුම් | භාවිතයට පියවර ගත යුතුය. | අදාළ දෙපාර්තමේන්තු සමඟ සාකච්ඡා කර භාවිතයට ගැනීමට පියවර |

| | | | |
|---|---|---|---|
| | පද්ධතියේ ඉදිකිරීම් කටයුතු 2018 නොවැම්බර් 11 දින රු.980,390 ක වියදමින් අවසන් කර තිබුණි. කෙසේ වෙතත්, එය මේ දක්වා භාවිතා කර නොතිබුණි. | | ගනිමින් සිටී. |
| (ඇ) | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ සංවර්ධන ප්‍රදාන යෝජනා ක්‍රමය යටතේ සභාව විසින් සිදු කරන ලද ආසික්කුලම්හි ජල ටැංකි සැපයුම් පද්ධතියේ ඉදිකිරීම් කටයුතු 2018 නොවැම්බර් 11 වන දින රු.1,883,353 ක වියදමින් අවසන් කර තිබුණි. කෙසේ වෙතත්, එය මේ දක්වා භාවිතා කර නොතිබුණි. | භාවිතයට පියවර ගත යුතුය. | අදාළ දෙපාර්තමේන්තු සමඟ සාකච්ඡා කර භාවිතයට ගැනීමට පියවර ගනිමින් සිටී. |

**3.6 ප්‍රසම්පාදනය**

--------------

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 වගන්තියට පටහැනිව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පරීක්ෂා කර අනුමත නොකළ රු.2,761,920 ක් වටිනා භාණ්ඩ හා සේවා විසිපහක් සභාව විසින් ලබාගෙන තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ක්‍රියා කළ යුතුය. | ඉදිරි කාලවලදී මිලදී ගනු ලබන සියලුම භාණ්ඩ සඳහා තාක්ෂණික ඇගයීම් වාර්තාවක් ලබා ගැනීමට පියවර ගෙන තිබේ. |
| (ආ) | සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සභාව විසින් රු.1,739,752 ක් වූ භාණ්ඩ හා සේවා 15 ක ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබුණි. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුය. | පිළිතුරු සපයා නොතිබුණි. |

**3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට පටහැනිව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂයේදී ප්‍රජා මධ්‍යස්ථාන සමඟ සම්බන්ධතා පැවැත්වීමෙන් සභාව විසින් | | |

| | | | |
|---|---|---|---|
| | රු.22,767,279 ක් වටිනා කොන්ත්‍රාත් වැඩ 35 ක් සිදු කර තිබුණි. මේ සම්බන්ධයෙන් නිරීක්ෂණ පහත පරිදි වේ. | | |
| (i) | චක්‍රලේඛයේ 3.1 වගන්තියට අනුව, 3.2 වගන්තිය යටතේ සඳහන් සුදුසුකම් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා සහ නියෝජිතයන් දෙදෙනෙකු ඇතුළු කමිටුවක් විසින් විමර්ශනය කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. | ප්‍රජා මධ්‍යස්ථානවලට කොන්ත්‍රාත්තු ප්‍රදානය කළ විට, සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපති හා ලේකම්, ප්‍රජා සංවර්ධන නිලධාරී සහ තාක්ෂණික නිලධාරියෙකු ඇතුළු කමිටුවක් පත් කර තිබුණි. විශේෂයෙන් කොන්ත්‍රත්තුවකට ඇතුළත් වීමේ හැකියාව සම්බන්ධයෙන් ප්‍රජා සංවර්ධන නිලධාරීන්ගේ නිර්දේශ ලබා ගැනීමෙන් පසුව ප්‍රජා මධ්‍යස්ථානවලට කොන්ත්‍රාත් ලබා දී තිබුණි. |
| (ii) | චක්‍රලේඛයේ 3.2 (iv) වගන්තියට පටහැනිව, එවැනි කොන්ත්‍රාත් කටයුතු ප්‍රජා මධ්‍යස්ථාන විසින් සිදු නොකොට උප කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම මගින් වෙනත් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් විසින් සිදු කර තිබුණි. 5% ක කොමිස් මුදලක් පමණක් ප්‍රජා මධ්‍යස්ථානවලට ලැබී තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. | අනාගත කාල පරිච්ඡේද තුළදී පරීක්ෂා කිරීමෙන් එවැනි කරුණු සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (iii) | චක්‍රලේඛයේ 3.2 (iv) වගන්තියට අනුව මෙම වාර්තාවේ දිනය දක්වා උප කොන්ත්‍රාත්තු වලට සම්බන්ධ ප්‍රජා මධ්‍යස්ථාන අසාදු ලේඛණයට ඇතුළත් කිරීමට සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. | එවැනි කාරණයක් සම්බන්ධයෙන් පැමිණිලි ලැබෙන්නේ නම්, ඉදිරි කාලවලදී මේ සම්බන්ධයෙන් විමසා බැලීමෙන් අදාළ පියවර ගනු ලැබේ. |
| (iv) | සමාලෝචිත වර්ෂය තුළ සභාව විසින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති කොන්ත්‍රාත් වැඩ 10 ක් සිදු නොකොට සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබුණි. | අයවැයගත කටයුතු සිදු කළ යුතුය. | සභාවේ අරමුදල් හිඟකම හේතුවෙන් එය සිදු නොකොට අතහැර දමා තිබුණි. |
| (v) | සමාලෝචිත වර්ෂය තුළ සභාව විසින් අයවැය සකස් කිරීමේදී අයවැය ලේඛනය සකස් කිරීමට සැලසුම් කර ඇති කොන්ත්‍රාත් වැඩ 11 ක් සඳහන් නොකර අයවැය සකස් කර තිබුණි. | අයවැය සකස් කිරීමේදී එය සකසන අවස්ථාවේ අගයන් සඳහන් කරමින් එය සකස් කළ යුතුය. | වැඩ ප්‍රමාණය වියදම් ශීර්ෂයේ දක්වා ඇත. කෙසේ වෙතත්, අගයන් ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ විස්තරවල වැරදි ලෙස සඳහන් කර නොතිබුණි. |
| (ආ) | වේලන්කුලම් සින්නතම්පානෙයි මාර්ගයේ ගල් තැබීම හා තාර දැමීම සඳහා වන කොන්ත්‍රාත් | චක්‍රලේඛ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. | එවැනි කොන්ත්‍රාත්කරුවෙකු අසාදු ලේඛණයට ඇතුළත් කිරීමට පියවර ගනිමින් සිටී. |

කටයුතු සමාලෝචනය කරන ලද වර්ෂයේදී සභාව විසින් ක්‍රියාත්මක කිරීමට අයවැය ගත කර තිබුණු අතර නිශ්චිත සංවර්ධන ප්‍රදානයක වැඩ යෝජනා ක්‍රමය යටතේ අක්සාවි කොන්ත්‍රාත්කරුවන් විසින් 2018 මාර්තු 21 දින රු.909,153 ක පිරිවැයකට කොන්ත්‍රාත්තුවක් අත්සන් කර තිබුණි. කෙසේ වෙතත්, එවැනි වැඩ සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබුණි. මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන්ට එරෙහිව සභාව විසින් කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

-----------------------------------------

**4.1 අයවැය පාලනය**

------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| අයවැය ලේඛනය නිසි පරිදි පිළියෙල කර නොතිබුණු අතර ඇස්තමේන්තුව නිසිලෙස සැලසුම් කර වැඩසටහන් ගත කර නොතිබුණු අතර ඒ අනුව අයවැයගත වියදම සහ තථ්‍ය වියදම අතර රු.2,999 සිට රු.5,414,026 ක් දක්වා විචලනයන් සිදුවිය. | අයවැය ඇස්තමේන්තුව නිසි ලෙස සකස් කළ යුතුය. | පිළිතුරු සපයා නොතිබුණි. |